ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2026.04.24

පැමිණිලි පාර්ශවය : එම්.එන්.එන්.ජේ. සමරසේකර මහතා,
බිහල්පොල,
නක්කාවත්ත.

වගඋත්තර පාර්ශවය : ප්‍ර.පො.ප. චන්ද්‍රසිරි රංජිත් මයා,
හිටපු ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
නාරම්මල.

**පැමිණිලි අංකය : HRC/2373/23**

**පැමිණිලිකරුගේ පැමිණිල්ල හා පැමිණිල්ල මගින් ඉල්ලා සිටින සහනය:**

පැමිණිලිකරු විසින් 2023.05.28 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කර ඇති පැමිණිල්ල මගින් සහ 2025.07.17 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී සිදුකළ පරීක්ෂණයේදී ලබාදුන් ප්‍රකාශය මගින් පහත කරුණු ඉදිරිපත් කර ඇත.

කොවුල්වැව, හොරොම්බාව ලිපිනයේ පදිංචි නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරී තනතුරෙහි රාජකාරි කරන අතාවුද මුදියන්සේලාගේ සමන් ආතාවුද යන අය සහ තමා අතර ඇතිවූ පුද්ගලික ආරවුලක් හේතුවෙන් සමන් අතාවුද යන අය 2021.11.06 දින රාත්‍රී 7ට පමණ ඔහුගේ වාහනයෙන් තමාගේ නිවසේ ගේට්ටුව අසලට පැමිණ යකඩ පොල්ලක්ද අතැතිව තමා මරණ බවට තර්ජනය කළ බවත්, පසුව ඔහුගේ කැබ් රථයට සහ ඔහු සතුව පවතින අනෙකුත් වාහනවලට යට කර මරණ බවට සඳහන් කරමින් තර්ජනය කළ බවත්, ඒ අනුව 2021.11.10 දින තමා නාරම්මල පොලිස් ස්ථානයට ගොස් සීඅයිබී (III) 248/72 යටතේ ඉහත කී පුද්ගලයාට විරුද්ධව පැමිණිල්ලක් ඉදිරිපත් කළ

බවත්, එම පැමිණිල්ල විභාගයට ගන්නා බව පවසා 2021.11.14 දින පොලිස් ස්ථානය වෙත පැමිණෙන ලෙස දැන්වූ බවත්, තමා එදින පොලිස් ස්ථානයට ගොස් පැමිණිල්ල විභාග කිරීමෙන් අනතුරුව එකී පැමිණිල්ල සමථයට පත්වූ බවත්, පසුව 2021.11.14 දින සමන් ආතාවුද යන අය විසින් තමා ඔහුට තර්ජනය කළ බව සඳහන් කරමින් තමාට විරුද්ධව නාරම්මල පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් ගොනු කර තිබූ බවත්, සමන් අතාවුද යන අයගේ බිරිඳ විසින් ද තමා සමන් අතාවුද යන අයට දුරකථනය ඔස්සේ තර්ජනය කළ බව සඳහන් කරමින් 2021.11.17 දින පැමිණිල්ලක් ගොනු කර තිබූ බවත්, 2022.06.12 දින නැවත සමන් අතාවුද යන අය විසින් තමාට විරුද්ධව පැමිණිල්ලක් ගොනු කර තිබූ බවත්, එම පැමිණිල්ල විභාග කිරීම සඳහා 2022.06.19 වන දින පොලිස් ස්ථානය වෙත ගිය නමුත් පෙ.ව. 11.30 පමණ වන තෙක් පැමිණිල්ල විභාගයට නොගත් නිසා තමා ස්ථානාධිපතිවරයා මුණගැසීමට ගිය බවත්, එහිදී පැමිණිල්ල ඉදිරිපත් කළ සමන් අතාවුද යන අය එදින පොලිස් ස්ථානය වෙත නොපැමිණීම හේතුවෙන් වෙනත් දිනයක් ලබාදෙන බවට ස්ථානාධිපතිවරයා තමා හට දැන්වූ බවත්, පසුව මෙම පැමිණිල්ල විභාගය සඳහා 2022.07.16 දින පොලිස් ස්ථානය වෙත ගිය අවස්ථාවේදී ස්ථානාධිපතිතුමා තමාට බැණ වැදුණ බවත්, පැමිණිල්ල සමථයට පත් නොවූ බවත්, 2023.05.21 දින තමා නිවසේ රැඳී සිටියදී නාරම්මල පොලිස් ස්ථානයේ නිලධාරියෙක් නිවසට පැමිණ තමාට සිතාසියක් භාර දුන් බවත්, 2023.05.23 දින තමා නාරම්මල පොලිසියට ගොස් සිතාසිය සම්බන්ධයෙන් විමසීමක් සිදුකළ බවත්, ඒ අනුව තමා උ.පො.ප. රත්නායක මහතා හමුවී සිතාසිය පෙන්වා තමාට විරුද්ධව ඇති චෝදනාව කුමක්ද යන්න විමසූ බවත්, එවිට තමා උසාවි රාජකාරි කරන ජයසූරිය මහතා වෙත යොමු කළ බවත්, උ.පො.ප. රත්නායක සහ උසාවි රාජකාරි කරන ජයසූරිය යන නිලධාරීන් දෙදෙනාම අදාළ ගොනු පරීක්ෂා කිරීමකින් ද තොරව නාරම්මල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති, ප්‍ර.පො.ප. චන්ද්‍රසිරි රංජිත් මහතා විසින් මෙම නඩුව ගොනු කර ඇති බවත්, නඩුව ගොනු කිරීමට හේතුව ස්ථානාධිපතිවරයා දන්නා බවත් සඳහන් කර, 2023.05.24 දින උසාවියට ගොස් චෝදනාව බලා ගන්නා ලෙස පැවසූ බවත්, ඒ අනුව තමා 2023.05.24 දින උසාවියට ගිය අවස්ථාවේදී අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 වන වගන්තිය යටතේ ඒක පාර්ශවීය බැඳුම්කරයකට ලක් කරමින් මෙම නඩු කටයුත්ත ගොනු කර ඇති බවට තමාගේ නීතිඥවරුන් මඟින් දැනගත් බවත්, ඒ අනුව රුපියල් ලක්ෂයක බැඳුම්කරයක් මත තමාට ඇප ලබා දීම සිදුකළ බවත්, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 වගන්තිය යටතේ තමාට එරෙහිව නඩු පැවරීමේදී පොලිසිය විසින් බැඳුම්කරයකට හෝ අත්සන් නොගෙන, සමථ මණ්ඩලය වෙත හෝ යොමු නොකර, නඩු පැවරීම සම්බන්ධයෙන් කිසිදු අයුරකින් දැනුවත් කිරීමකින් ද තොරව අදාළ නඩුව ගොනු කර ඇති බවත්, මෙම සිද්ධි දාමයට අදාළව තමා විසින් සිදුකළ මුල් පැමිණිල්ල සම්බන්ධයෙන්ද කරුණු සඳහන් නොකරමින් එම මුල් තොරතුරු වසන් කරමින් නීතිමය ප්‍රතිපාදන පිළිබඳවද නොදැන 2022.08.24 දිනැතිව අධිකරණයට කරුණු වාර්තා කර ඇති බවත්, ඒ අනුව මෙසේ ඒකපාර්ශවිකව තමාට එරෙහිව නඩු පැවරීම හේතුවෙන් තමාගේ මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවට හැඟී ගිය බවත්, ඒ අනුව 2023.05.28 දින තමාගේ මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවටත්, 2023.05.30 දින පොලිස්පතිතුමා වෙතත්, එදිනම ජාතික පොලිස් කොමිෂන් සභාවටත් පැමිණිලි යොමු කළ බවත්, තමාට විරුද්ධව කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු

කර තිබූ අංක 11965/81 දරණ නඩුවේ නඩු විභාගය අවසානයේදී 2024.11.08 දින අවසන් තීරණය ලබාදෙමින් (නඩුවේ තීන්දුව ලබාදෙන අවස්ථාව වන විට නාරම්මල මහේස්ත්‍රාත් අධිකරණය ස්ථාපිත වී ඇත) තමාට එරෙහිව ඉදිරිපත්ව තිබෙන කරුණු අනුව නාරම්මල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාට ඒකපාර්ශවිකව අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 යටතේ නඩුවක් ගොනු කළ නොහැකි බව පවසමින් තමා එම නඩුවෙන් නිදහස් කළ බවත්, එම සිද්ධියට අදාළව පොලිස් කොමිෂන් සභාවේ ගොනු කරන ලද පැමිණිල්ල විභාග කර, ස්ථානාධිපතිවරයාගේ ඉදිරි සේවා කාලය හා පෙර ඉටු කළ යහපත් රාජකාරි සම්බන්ධයෙන් සැලකිල්ලට ගෙන චෝදනා පත්‍රයක් නිකුත් නොකිරීමටත්, මින් ඉදිරියට රාජකාරී කටයුතු කිරීමේදී පැවරෙන රාජකාරිය පිළිබඳ අවබෝධයෙන් ශ්‍රී ලංකා පොලිසියේ ගෞරවය රැකෙන පරිදි රාජකාරි කරන ලෙසට අවවාද කරමින් අවවාද ලිපියක් නිකුත් කර ඇති බවත්, නඩු කටයුත්ත හේතුවෙන් ඇතිවුණු බලපෑම් මත තමාගේ පදිංචිය මාරු කිරීමට ද සිදුවූ බවත්, ඒ අනුව සිදුවූ අසාධාරණයට සාධාරණයක් අපේක්ෂා කරමින් මෙම පැමිණිල්ල ඉදිරිපත් කළ බවට පැමිණිලිකරු සඳහන් කර ඇත.

<u>වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම:</u>

මෙම සිදුවීම සිදුවන අවස්ථාව වන විට නාරම්මල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වශයෙන් කටයුතු කළ ප්‍ර.පො.ප. සිල්පාධිපතිගේ චන්ද්‍රසිරි රංජිත් මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී සිදුකළ පරීක්ෂණ කටයුතුවලදී පහත ප්‍රකාශය සිදුකර ඇත.

2021.11.10 වන දින CIB (III) 248/72 යටතේ එම්.එන්.එන්.ජේ. සමරසේකර යන අය (පැමිණිලිකරු) විසින් ස්ථානයට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්, ඒ අනුව විවිධ පැමිණිලි අංශයට මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් අපක්ෂපාතී විමර්ශනයක් කරන ලෙසට තමා විසින් වාචික උපදෙස් හා නියෝග ලබාදී ඇති බවත්, 2021.11.14 වන දින විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති විසින් දෙපාර්ශවය පොලිස් ස්ථානය වෙත කැඳවා දෙපාර්ශවයේ එකඟතාවය මත පැමිණිල්ල සමථයකට පත්ව, එකී පැමිණිල්ල අවසන් කර ඇති බවත්, ඉන්පසු නැවත 2021.11.14 දිනැතිව ඒ.එම්.එස්. අතාවුද යන අය විසින් ද(CIB (III) 295/108), 2021.11.17 දිනැතිව සේනාධිපති මුදියන්සේලාගේ මල්ලිකා යන අය විසින් ද(CIB (III) 358/153) එම්.එන්.එන්.ජේ. සමරසේකර යන අයට විරුද්ධව ඉදිරිපත් කර ඇති පැමිණිලිවලට අනුව අදාළ වගඋත්තරකරු වන එම්.එන්.ජේ සමරසේකර යන අය තමා වෙත කැඳවා දෙපාර්ශවයේ කරුණු විමර්ශනය කළ බවත්, ඒ අනුව දෙපාර්ශවයටම කරුණු පැහැදිලි කර දුන් බවත්, පවුල් ජීවිත සාර්ථකව ගෙන යාම සඳහා මින් ඉදිරියට මෙවැනි සිදුවීම් සිදු නොවීමට වග බලා ගන්නා ලෙසට දෙපාර්ශවයටම කරුණු අවබෝධ කර දී සමාජය පිළිබඳව දැනුවත් කිරීමක් සිදු කරන ලද බවත්, දෙපාර්ශයටම සාමයෙන් සිටින ලෙසට උපදෙස් ලබාදී මින් ඉදිරියේදී මෙවැනි පැමිණිලි සිදු වුවහොත් ඒ සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කිරීමට සිදුවන බවට දෙපාර්ශවය වෙත උපදෙස් ලබාදී පැමිණිලි දෙකම සමථයට පත්ව තමා ඉදිරිපිට අත්සන් තබන ලද බවත්, ඉන් අනතුරුව

නැවත 2022.06.12 දින එම්.එන්.එන්.ජේ. සමරසේකර යන අයට විරුද්ධව නැවත පැමිණිල්ලක් ලැබී තිබූ බැවින් ඒ සම්බන්ධයෙන් ස්ථානාධිපති, සුළු පැමිණිලි විසින් විභාග කිරීමක් සිදු කර තමා වෙත දැනුම් දීමෙන් පසු දිගින් දිගටම පැමිණිලි ස්ථානයට වාර්තා වන හෙයින් මේ සම්බන්ධයෙන් අධිකරණයට ඉදිරිපත් කිරීම සුදුසු බවට තමා විසින් ස්ථානාධිපති, සුළු පැමිණිලි වෙත උපදෙස් ලබාදුන් බවත්, අ.න.වි.ස. 81 වගන්තියේ අපේක්ෂාව වනුයේ සැමවිටම පාර්ශව දෙකක් අතර සාමය ආරක්ෂා කිරීම සඳහා සාමය කඩ කරන බවට හැඟී යන පුද්ගලයා හෝ පාර්ශවය හඳුනාගෙන එය වළක්වා ගැනීම සඳහා හෝ නවත්වා ගැනීම සඳහා බැඳුම්කරයකට යටත් කිරීම වන බවත්, ඒ අනුව තමා 2021.11.14, 2021.11.17 සහ 2021.06.12 දිනයන්හි වාර්තා වී ඇති පැමිණිලි සම්බන්ධයෙන් නීතියේ ක්‍රියාපටිපාටියට අනුව ක්‍රියා කරන ලෙස ස්ථානාධිපති, විවිධ පැමිණිලි වෙත උපදෙස් ලබාදුන් බවත්, ස්ථානාධිපති, විවිධ පැමිණිලි විසින් එම්.එන්.එන්.ජේ. සමරසේකර යන අය (පැමිණිලිකරු) දැනුවත් කර, බැඳුම්කර අත්සන් කරවා ගරු අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු වාර්තාව කෙටුම්පත් කර තමා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු තමා එයට අත්සන් යෙදූ බවත්, දිගින් දිගටම සමන් අතාවුද යන අය විසින් එම්.එන්.එන්.ජේ. සමරසේකර යන අයට එරෙහිව පොලිස් ස්ථානය වෙත පැමිණිලි ඉදිරිපත් කර තිබීම හේතුවෙන් තවදුරටත් දෙපාර්ශවය අතර පවතින ගැටළුකාරී තත්වය මගින් සාමය කඩවීමක් සිදුවන බවට පෙනී ගිය බැවින් මෙම කාරණය සමථ මණ්ඩලයට යොමු කිරීමෙන් තොරව අධිකරණයේ නඩු පැවරීමට කටයුතු කළ බවත්, එහිදී මෙම පැමිණිලිකරුට එරෙහිව දිගින් දිගටම පැමිණිලි ලැබී තිබීම හේතුවෙන් ඔහු පමණක් පාර්ශවකරුවෙක් කරමින් නඩු පැවරීම සිදු කරන ලද බවත්, මෙම සිදුවීමේදී තමා ඉහත පරිදි විනිවිදභාවයෙන් කටයුතු කර ඇති බවත්, කිසිදු අවස්ථාවක අසමානතාවයකින් සළකා නොමැති බවත්, එසේම කුලියාපිටිය ම/උ නඩු අංක 11965/81 දරණ නඩුව සඳහා පාදක කරගෙන ඇත්තේ 2021.11.14, 2021.11.17 හා 2022.06.12 යන දිනවල වාර්තා වී ඇති සාමය කඩවීම් වන බවත්, ඒ අනුව මෙම පැමිණිලිකරුට තමා විසින් කිසිදු අසමානතාවයකින් සළකා නොමැති බවත්, ඔහු විසින් ඉදිරිපත් කර ඇති පැමිණිල්ල අපක්ෂපාතීව දෙපාර්ශවය ස්ථානයට කැඳවා ස්ථානාධිපති, විවිධ පැමිණිලි විසින් ද තමා විසින් ද එකී පැමිණිලි විභාග කර ඇති බවත්, මෙම පැමිණිලිකරු තමා ස්ථානාධිපති ලෙස සිටි කාලයේදී කිසිදු අවස්ථාවක තමා පුද්ගලිකව හමුවී නොමැති බවත්, පුද්ගලිකව හඳුනන්නේද නැති බවත්, එසේම මෙහි අනෙක් පාර්ශවයන්ද තමා කිසිදු දිනක හමුවී හෝ පුද්ගලිකව හඳුනන්නේ නැති බවත්, මෙම පැමිණිලිකරු කිහිප අවස්ථාවකදී පොලිස් ස්ථානයට ගෙන්වීම හෝ පැමිණ ආපසු යාම සම්බන්ධයෙන් තමාගේ දැනුවත්භාවයක් නොමැති බවත් ප්‍රකාශ කර ඇත.

<u>නිරීක්ෂණ:</u>

මෙම පැමිණිල්ලට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී සිදුකරන ලද පරීක්ෂණ කටයුතුවලදී පැමිණිලිකාර එම්.එන්.එන්.ජේ. සමරසේකර සඳහන් කර ඇත්තේ, මෙම සිදුවීම සිදුවන අවස්ථාව වන විට නාරම්මල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වශයෙන් කටයුතු කළ ප්‍රධාන පොලිස් පරීක්ෂක, සිල්පාධිපතිගේ චන්ද්‍රසිරි රංජිත් මහතා විසින් අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 81 වගන්තිය ප්‍රකාරව තමාට එරෙහිව ඒකපාර්ශවිකව නඩු පැවරීමට කටයුතු කර ඇති බැවින් ස්ථානාධිපතිවරයාගේ එකී ක්‍රියාකලාපය සම්බන්ධයෙන් මෙම පැමිණිල්ල පවත්වාගෙන යාමට අදහස් කරන බවයි.

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 වගන්තිය අනුව බැඳුම්කරයකට යටත් කළ හැකි පුද්ගල කොට්ඨාශයන් පහත පරිදි වේ.

1. මහේස්ත්‍රාත් අධිකරණයක බල සීමාවේදී සාමය කඩ කරනු ලැබීමට හෝ සාමය කඩ වීමක් සිදුවිය හැකි යම් වැරදි ක්‍රියාවක් කරනු ලැබීමට ඉඩ ඇති බවට දැක්වෙන යම් තැනැත්තෙක්.
2. මහේස්ත්‍රාත් අධිකරණයෙන් පිට බල සීමාවක් තුල සාමය කඩ කිරීමට හෝ ඉහතින් දක්වා ඇති වැරදි ක්‍රියාවක් කිරීමට ඉඩ ඇති යම් තැනැත්තෙක්.

<u>අබේවර්ධන</u> *එදිරිව* <u>ප්‍රනාන්දු</u> **(1924) 27 NLR 97 P.98** නඩුවේදී ගරු මහේස්ත්‍රාත් අධිකරණය විසින් සඳහන් පහත පරිදි සඳහන් කර ඇත.

> ***"A breach of the peace, within the meaning of sections 80 and 81 of the Criminal Procedure Code, involves some violent interference either with person or property or some violent act calculated to alarm the King's subjects."***

ඒ අනුව, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 වගන්තිය ප්‍රකාරව පුද්ගලයින්ට හෝ දේපලවලට එරෙහිව හිංසාකාරී මැදිහත්වීමක් සිදුව තිබෙන අවස්ථාවකදී නඩු පැවරීමේ හැකියාව පවතී.

හුදු පවුල් දෙකක් අතර ඇති වූ ආරවුලක් මත පදනම්ව සාමය කඩවන අවස්ථාවක එකී වගන්තිය යටතේ නඩු පැවරීමේ හැකියාව පැවතියද මෙහිදී එක් පාර්ශවයක් පමණක් ඉලක්ක කර ගනිමින් ස්ථානාධිපතිවරයා විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව, ස්ථානාධිපතිවරයා විසින් 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 81 වගන්තිය ප්‍රකාරව කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 11965 යටතේ එම්.එන්.එන්.ජේ. සමරසේකර (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ල ගොනු කර ඇති පැමිණිලිකරු) යන අයට එරෙහිව පමණක් නඩු පවරා ඇති අතර, 2024.11.08 දින එකී නඩුවේ තීන්දුව ලබාදෙමින් (නඩුවේ

තීන්දුව ලබාදෙන අවස්ථාව වන විට නාරම්මල මහේස්ත්‍රාත් අධිකරණය ස්ථාපිත වී ඇත) ගරු මහේස්ත්‍රාත්වරිය සඳහන් කර ඇත්තේ, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 වගන්තියට අදාළව විධිමත් හා නිසි විමර්ශනයකින් තොරව මෙම නඩුව 81 වගන්තිය ප්‍රකාරව පවරා පවත්වාගෙන යාමට නාරම්මල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාට නොහැකි බවත්, ඒ අනුව නඩුවේ වගඋත්තරකරු වන එම්.එන්.එන්.ජේ. සමරසේකර යන අය නිදහස් කරන බවත් ය.

තවද ගරු මහේස්ත්‍රාත් වරිය විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ, අතාවුද මුදියන්සේලාගේ සමන් අතාවුද යන අය විසින් 2021.11.14 දින පොලිස් ස්ථානය වෙත පැමිණිලි කිරීමට ප්‍රථම මෙම නඩුවේ වගඋත්තරකරු වන එම්.එන්.එන්.ජේ. සමරසේකර යන අය විසින් ද පැමිණිල්ලක් ගොනු කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් විභාගයක් පොලිස් ස්ථානය විසින් කර ඇති නමුත් ස්ථානාධිපතිවරයා විසින් එකී පැමිණිල්ල සම්බන්ධයෙන් වූ ලේඛන කිසිවක් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් තොරව හුදු අතාවුද මුදියන්සේලාගේ සමන් අතාවුද සහ ඔහුගේ බිරිඳගේ කටඋත්තරය පමණක් ඉදිරිපත් කරමින් මෙම නඩුව එම්.එන්.එන්.ජේ. සමරසේකර යන අයට එරෙහිව පවරා ඇති බවයි.

තවද එකී පැමිණිලි හා කටඋත්තරය මඟින් මෙම පාර්ශවයන්ගේ ජීවිතයට සහ පවුලේ අයගේ ජීවිතවලට බලපෑම් එල්ල විය හැකි ආකාරයේ සාමය කඩවීමේ තත්ත්වයක් උද්ගත වීමට ඉඩකඩ ඇති බවට කරුණු වාර්තා කර ඇති නමුත් ඒ බව සනාථ කිරීමට ස්වාධීන සාක්ෂිකරුවන්ගේ නම් අනාවරණය වී තිබුණද ඒ සම්බන්ධයෙන් නිසි විමර්ශනයකින් තොරව අධිකරණයට කරුණු වාර්තා කර ඇති බවට පෙනී යන බවත්, එම වාර්තාව සමඟ අතාවුද මුදියන්සේලාගේ සමන් අතාවුද යන අය විසින් 2021.11.14 සහ 2022.06.12 යන දිනවල සිදුකර ඇති පැමිණිලි ගොනු කර ඇති බවට නිරීක්ෂණය වන නමුත් පළමු පැමිණිල්ල සිදුකර මාස 6කට පමණ පසුව දෙවන පැමිණිල්ල වාර්තා වී ඇති බවට පෙනී යන බැවින් ස්ථානාධිපතිවරයා විසින් දෙවන පැමිණිල්ල වාර්තා වීමෙන් අනතුරුව මෙම නඩුව නිසි විමර්ශනයකින් තොරව පාර්ශවයන් අතර ඉමහත් සාමය කඩවීමේ තත්ත්වයක් උද්ගත වීමට ඉඩ ඇති බවට හුදු කරුණු කියාපෑමක් කරමින් මෙම නඩුව පවරා ඇති බවට අධිකරණයට පෙනී යන බවට මෙම නඩුවේ තීන්දුව ලබාදෙමින් ගරු මහේස්ත්‍රාත්වරිය සඳහන් කර ඇත.

එමෙන්ම එම්.එන්.එන්.ජේ. සමරසේකර (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ල ගොනු කර ඇති පැමිණිලිකරු) යන අය විසින් ස්ථානාධිපතිවරයා කටයුතු කළ ආකාරය තුළින් තමාට අගතියක් සිදුවූ බව සඳහන් කරමින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද පැමිණිල්ලට අදාළව සිදුකළ විමර්ශනයේදී පහත කරුණු අනාවරණය වී ඇත.

- බිහල්පොල, නක්කාවත්ත ලිපිනයේ පදිංචි ශ්‍රී ලංකා පොලිසියට අනුයුක්තව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභාවේ සේවය කරන පොලිස් සැරයන් 21499 එම්. එන්. එන්. ජයවික්‍රම සමරසේකර යන අයට නාරම්මල පොලිස් වසමේ පදිංචිකරුවෙකු වන අතාවුද මුදියන්සේලාගේ සමන් අතාවුද නැමැත්තා විසින් පුද්ගලික ආරවුලක් මත තම නිවස අසලට කැබ් රථයකින් පැමිණ යකඩ පොල්ලක් රැගෙන කැබ් රථයෙන් බැස මරණීය තර්ජන එල්ල කිරීම සම්බන්ධයෙන් 2021.11.10 දින නාරම්මල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සඳහා ප්‍රධාන පොලිස් පරීක්ෂක සිල්පාධිපතිගේ චන්ද්‍රසිරි රංජිත් විසින් නිසි විමර්ශනයක් සිදු කර නොමැති බවට අනාවරණය වේ.

- තවද මෙම පැමිණිලිකරු විසින් සමන් අතාවුද යන අයට බැන තර්ජනය කිරීමක් සම්බන්ධයෙන් 2021.11.14 දින සමන් අතාවුද යන අය විසින් නාරම්මල පොලිස් ස්ථානය වෙත කර ඇති පැමිණිල්ල සහ සමන් අතාවුද නැමැත්තාගේ බිරිඳ වන සේනාධිපති මුදියන්සේලාගේ මල්ලිකා නැමැත්තියගේ ජංගම දුරකථනයට එම්.එන්.එන් ජයවික්‍රම සමරසේකර යන අය විසින් දුරකථන ඇමතුම් ලබාගෙන කරදර කිරීමක් සම්බන්ධයෙන් 2022.11.17 වන දින සේනාධිපති මුදියන්සේලාගේ මල්ලිකා නැමැති අය විසින් ඉදිරිපත් කර ඇති පැමිණිලි සම්බන්ධයෙන් පමණක් ප්‍රධාන පොලිස් පරීක්ෂක සිල්පාධිපතිගේ චන්ද්‍රසිරි රංජිත් විසින් දෙපාර්ශවය නාරම්මල පොලිස් ස්ථානය වෙත කැඳවා විභාග කිරීමෙන්ද, දෙපාර්ශවයෙන්ම එකිනෙකාට විරුද්ධව පැමිණිලි කිහිපයක් වාර්තා වී තිබිය දී දෙපාර්ශවය අතර දිගින් දිගටම ආරවුල් ඇතිවීම වැළැක්වීම සඳහා දෙපාර්ශවය අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සිදු කළ යුතුව තිබූ නමුත් එසේ සිදු කර නොමැති බව ද අනාවරණය වේ.

- තවද අදාළ විමර්ශනයේදී වැඩිදුරටත් අනාවරණය වී ඇත්තේ, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 81 වගන්තිය යටතේ මෙම ආරවුල සම්බන්ධයෙන් අධිකරණය වෙත වාර්තා කරන බව දෙපාර්ශවයට දැනුම් දී, ඇප බැඳුම්කර අත්සන් කරවා ගැනීමෙන් පසුව එසේ දෙපාර්ශවයේම සාමය ආරක්ෂා කිරීම උදෙසා අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සිදු කල යුතු වුවත් එසේ සිදු නොකර එම්.එන්.එන් ජයවික්‍රම සමරසේකර යන අයට විරුද්ධව ඇති පැමිණිලි සඳහා පමණක් ස්ථානාධිපතිවරයා විසින් 2022.08.24 වන දින, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 වගන්තිය යටතේ කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 11965/81 යටතේ ඒක පාර්ශවිකව ගරු අධිකරණයට කරුණු වාර්තා කිරීම තුළින් ස්ථානාධිපතිවරයෙකු ලෙස මහජන දෝෂ දර්ශනයට ලක්වන ආකාරයෙන් අනවබෝධයෙන් යුතුව පැමිණිලි විමර්ශනය සිදු කර සිය රාජකාරිය පැහැර හැරීමක් සිදු කර ඇති බවයි.

එකී කරුණු පදනම් කර ගනිමින් වගඋත්තරකරු වන නාරම්මල පොලිස් ස්ථානයේ හිටපු ස්ථානාධිපති, ප්‍රධාන පොලිස් පරීක්ෂක සිල්පාධිපතිගේ චන්ද්‍රසිරි රංජිත් ශ්‍රී ලංකා පොලිස් නියෝග ඒ 7 කී පරිශිෂ්ටයේ

විනය සංග්‍රහයේ වගන්ති 4(ඒ) අනුව, රාජකාරි පැහැර හැරීම යන චෝදනාව යටතේ දඬුවම් ලැබිය හැකි රාජකාරි පැහැර හැරීමේ වරද සිදුකර ඇති බවට කරුණු අනාවරණය වී ඇති බැවින් ඔහුට විරුද්ධව චෝදනා පත්‍රයක් නිකුත් කර විනය ක්‍රියාමාර්ග ගැනීමට හැකියාවක් ඇති නමුත් ඔහුගේ ඉදිරි සේවා කාලය පිළිබඳව සහ පෙර ඉටු කරන ලද යහපත් රාජකාරි සම්බන්ධයෙන් සැලකිල්ලට ගනිමින් ඔහුට එරෙහිව චෝදනා පත්‍රයක් නිකුත් කිරීමෙන් තොරව මින් මතුවට මෙවැනි ආකාරයට නොසැලකිළිමත් ලෙස කටයුතු නොකිරීමටත්, තමාට පැවරෙන රාජකාරිය පිළිබඳව අවබෝධයෙන් හා වගකීමෙන් කටයුතු කරමින් ශ්‍රී ලංකා පොලිසියේ ගෞරවය ආරක්ෂා කරමින් ඉදිරි රාජකාරි කටයුතු ඉටු කළ යුතු බවට ශ්‍රී ලංකා පොලිස් නියෝග ඒ 08 (2)(1)හි සඳහන් විධිවිධාන අනුව හා ජාතික පොලිස් කොමිෂන් සභාවේ නියෝග ප්‍රකාරව උතුරු මැද දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති (රා/ඉ), අයි.ජී.බී. සුගතපාල මහතා විසින් වගඋත්තරකරු වෙත අවවාද පත්‍රයක් නිකුත් කර ඇත.

**නිගමනය:**

ඉහත නිරීක්ෂණවලට අනුව, නාරම්මල පොලිස් ස්ථානයේ හිටපු ස්ථානාධිපති, ප්‍රධාන පොලිස් පරීක්ෂක සිල්පාධිපතිගේ චන්ද්‍රසිරි රංජිත් මහතා විසින් එම්.එන්.එන්. ජයවික්‍රම සමරසේකර, අතාවුද මුදියන්සේලාගේ සමන් අතාවුද සහ අතාවුද මුදියන්සේලාගේ සමන් අතාවුද යන අයගේ බිරිඳ වන සේනාධිපති මුදියන්සේලාගේ මල්ලිකා යන පාර්ශවයන් විසින් නාරම්මල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර තිබූ පැමිණිලි විධිමත් පරිදි විමර්ශනය කිරීමකින් තොරව මෙකී පැමිණිලිකාර එම්.එන්.එන්. ජයවික්‍රම සමරසේකර යන අයට විරුද්ධව අතාවුද මුදියන්සේලාගේ සමන් අතාවුද සහ ඔහුගේ බිරිඳ වන සේනාධිපති මුදියන්සේලාගේ මල්ලිකා යන අය විසින් ඉදිරිපත් කර තිබූ පැමිණිලි සම්බන්ධයෙන් පමණක් අවධානය යොමු කරමින් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

එසේම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 81 වගන්තිය යටතේ විධිමත් විමර්ශනයකින් තොරව එක් පාර්ශවයකට පමණක් වාසිදායක වන ලෙස ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කිරීම තුළින් ස්ථානාධිපතිවරයා තම රාජකාරි නීතියට අනුකූලව නිසි ලෙස ඉටුකර නොමැති බවත්, ඒ අනුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කර ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිවාසිකම වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවත් මෙයින් නිගමනය කරනු ලැබේ.

කෙසේනමුත් මින් මතුවට මෙවැනි ආකාරයට නොසැලකිළිමත් ලෙස කටයුතු නොකිරීමටත්, තමාට පැවරෙන රාජකාරිය පිළිබඳව අවබෝධයෙන් හා වගකීමෙන් කටයුතු කරමින් ශ්‍රී ලංකා පොලිසියේ ගෞරවය ආරක්ෂා කරමින් ඉදිරි රාජකාරි කටයුතු ඉටු කළ යුතු බවට සඳහන් කරමින් මේ වන විටත් වගඋත්තරකාර පාර්ශවය වෙත අවවාද පත්‍රයක් නිකුත් කර විනය පියවර ගෙන ඇති බැවින් තවදුරටත්

වගඋත්තරකරු සම්බන්ධයෙන් මෙම සිදුවීමට අදාළව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමක් නිර්දේශ කරනු නොලබයි.

එල්.ටී.බී. දෙහිදෙණිය,

හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු,

සභාපති,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,

කොමසාරිස්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් -: (01) අමාත්‍යතුමා, - කාරුණික දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
18වන මහල, සුහුරුපාය,
බත්තරමුල්ල.

(02) ලේකම්, - කාරුණික දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
18වන මහල, සුහුරුපාය,
බත්තරමුල්ල.

(03) පොලිස්පතිතුමා, - කාරුණික දැනගැනීම සඳහා
පොලිස් මූලස්ථානය,
කොළඹ 02.